# FINANCIAL MANAGEMENT (Part-IX)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

කොටස් වෙළෙඳ පොළක ගනුදෙනු ක්‍රියාකාරී ද, නැත්ද යන්න විග්‍රහ කිරීම සඳහා පොදු සංඛ්‍යා දර්ශක රැසක් ලෝකයේ භාවිත වන අතර ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ කාර්යසාධනය මැනීම සඳහා පහත මිල දර්ශක යොදා ගනී.

## කොටස් වෙළෙඳ පොළේ කාර්යසාධනය මැනීම සඳහා යොදා ගන්නා මිල දර්ශක

- සියලු කොටස් මිල දර්ශකය (ASPI) All Share Price Index
- S & P ශ්‍රී ලංකා 20 දර්ශකය S & P SL 20 Index
- මුළු ප්‍රතිලාභ දර්ශකය (TRI) Total Return Index

ClassWork.LK

# සියලු කොටස් මිල දර්ශකය

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ සමාගම් සියල්ලේ ම ඡන්ද බලය හිමි සාමාන්‍ය කොටස්වල මිල ගණන්හි ඇති වන උච්චාවචන පෙන්නුම් කරන දර්ශකය සියලු කොටස් මිල දර්ශකය යි. මෙම දර්ශකය සඳහා සැකසීමේ දී 1985 වසර පාදක වර්ෂය ලෙස යොදා ගන්නා අතර, පාදක දර්ශක අගය 100 ලෙස යොදා ගනී.

සියලු කොටස් මිල දර්ශකය පහත පරිදි ගණනය කරයි.

$$\text{සියලු කොටස් මිල දර්ශකය} = \frac{\text{සියලු ලැයිස්තුගත සමාගම්වල වර්තමාන වෙළඳ පොළ ප්‍රාග්ධනීකරණය}}{\text{තෝරාගත් සමාගම් 20 හි පාදක දිනයේ වෙළෙඳ පොළ ප්‍රාග්ධනීකරණය}} \times 100$$

ClassWork.LK

❖ ඉහත දර්ශකවලට අමතර ව මුළු ප්‍රතිලාභ දර්ශක ද දෛනික ව සකස් කරයි. මෙය 2004 වර්ෂයේ හඳුන්වා දුන් අතර මෙය කොටස් මිල වෙනස් වීම සහ ලාභාලාභ ආදායම යන සාදක දෙක ම සැලකිල්ලට ගනිමින් සකස් කරයි.

❖ සියලු කොටස් මිල දර්ශකය මුළු ප්‍රතිලාභ යන පදනම යටතේ ගණනය කළ විට සියලු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය - ( ASTRI ) ලෙස ද S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය මුළු ප්‍රතිලාභ යටතේගණනය කළ විට S & P ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය ( S & PTRI ) ලෙස ද හඳුන්වයි.

ClassWork.LK

## කොටස් වෙළෙඳ පොළ මිල දර්ශකවල වැදගත්කම

- ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳ ව යම් අවබෝධයක් ලැබිය හැකි වීම.
- ආර්ථිකයෙහි සමාගම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ ව යම් අවබෝධයක් ලැබිය හැකි වීම.
- වෙනත් රටවල කොටස් වෙළෙඳ පොළ තත්ත්වයන් සමග සංසන්දනය කළ හැකි වීම.
- ආයෝජන තීරණ ගැනීමේ දී ආධාර කර ගත හැකි වීම.

❖ කොටස් වෙළෙඳ පොළ මිල දර්ශක කාලීන ව වෙනස් විය හැකි අතර එම මිල දර්ශක ගණනය කරන ආකාරය ද වෙනස් විය හැකි බැවින් කාලීන තොරතුරු ගැන ද සැලකිලිමත් වන්න

Class Work.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura